සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 62 S

# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය දෙකයි

**නම හා විභාග අංකය :**

● ප්‍රශ්න අංක 01 - 30 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ඇමරිකා එක්සත් ජනපදයේ පැවති වහල්භාවය නැතිකර සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමට මුල් වූ ප්‍රබල නායකයෙකි.
   1. බැරක් ඔබාමා　　2. හිලරි ක්ලින්ටන්
   3. ඒබ්‍රහම් ලින්කන්　　4. ඩොනල්ඩ් ට්‍රම්ප්

02. "සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම" යන දැක්ම සහිතව රටට විශාල සේවයක් කරන ආයතනයකි.
   1. බන්ධනාගාර දෙපාර්තමේන්තුව　　2. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
   3. නීතිපති දෙපාර්තමේන්තුව　　4. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

03. ඕනෑම රටක ආර්ථිකයේ සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුන වන්නේ,
   1. නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය　　2. නිෂ්පාදනය, කාර්මික ,සේවායි
   3. නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවියයි　　4. බෙදහැරීම, පරිභෝජනය, සේවායි

04. සහජීවන ගුණාංගයක් නොවන්නේ,
   1. සුහද බවයි.　　2. වංකබවයි.　　3. සුබවාදී බවයි.　　4. බෙදා හදා ගැනීමයි.

05. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වූයේ,
   1. නගර සභාවයි.　　2. පළාත් සභාවයි.　　3. ජාතික සභාවයි.　　4. පුරවැසි සභාවයි.

06. 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංකරණය තුළින් අවුරුදු 21 ට වැඩි සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා සර්වජන ජන්ද බලය හිමිවිය. ඉන්පසු අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ට සර්ව ජන ඡන්ද බලය හිමි වූයේ කුමන වර්ෂයේ සිට ද?
   1. 1958 සිට　　2. 1948 සිට　　3. 1972 සිට　　4. 1978 සිට

07. පළාත් පාලන ආයතනවල පරිපාලන බලය අධීක්ෂණය කිරීමේ බලතල පළාත් සභාවලට පැවරුවේ කුමන ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයේ ද?
   1. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ 19 වන සංශෝධනයෙන්
   2. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිංස්කරණයේ 13 වන සංශෝධනයෙන්
   3. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිංස්කරණයේ 20 වන සංශෝධනයෙන්
   4. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිංස්කරණයේ 17 වන සංශෝධනයෙන්

08. ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක වන්නේ,
   1. කෑගල්ල, රත්නපුර　　2. කුරුණෑගල, පුත්තලම　　3. බදුල්ල, මොණරාගල　　4. අනුරාධපුර, පොළොන්නරුව

09. ළමා හිංසනය හා අපචාර පිළිබඳව දැනුම් දීම සඳහා ඇති ඍජු දුරකථන අංකය වන්නේ,
   1. 1929　　2. 1948　　3. 1972　　4. 1919

10. "අධ්‍යාපනය ලැබූ අයගේ යහගුණ පූර්ණ චන්ද්‍රයා මෙන් වැඩිවේ. අධ්‍යාපනයේ අඩු අයගේ යහගුණ අමාවක මෙන් අඩු වී යයි." මෙම යහ ජීවන ගුණාංගය උපුටා ගන්නා ලද ග්‍රන්ථය වන්නේ,
   1. සිරිත්මල් දම ග්‍රන්ථයෙන්　　2. ලෝකෝපකාරය　　3. සද්ධර්මරත්නාවලිය　　4. නිරුක්තුරල්

11. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,
   1. ජනාධිපතිතුමා ය.　　2. අගවිනිසුරුතුමා ය.　　3. නීතිපතිතුමා ය.　　4. අධිකරණ ඇමතිතුමා ය.

12. සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විවිධ නීති සකස් කර ඇත. එම නීති සකස් කිරීමේ දී මුල් වූ නීති මූලාශ්‍ර 2 ක් වන්නේ,
   1. ආගම හා පවුලයි　　2. පවුල හා සමාජයයි.
   3. අධිකරණ තීරණ හා සිරිත් විරිත්ය　　4. පාසල හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.

13. ඉඩම් ගැටළු, පවුල් ආරවුල් සම්බන්ධව පවතින නීතිය වන්නේ,
   1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.　　2. සිවිල් නීතියයි.　　3. අපරාධ නීතියය　　4. අන්තර්ජාතික නීතියයි.

14. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අප රටේ
   1. මූලික නීතියයි.　　2. සිවිල් නීතියයි.　　3. අපරාධ නීතියයි.　　4. දේශීය නීතියයි.

15. තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා යොදා ගනු ලබන ක්‍රමවේදය ,
1. තිරසාර සංවර්ධනයයි 2. ඵලදායීතාවයයි. 3. තාක්‍ෂණයයි. 4. යෝග්‍ය තාක්‍ෂණයයි.

16. සමූපකාර ව්‍යාපාරයේ පියා වන්නේ,
1. රොබට් බ්‍රවුන්රිග් 2. රොබට් නොක්ස් 3. රොනල්ඩ් රේගන් 4. රොබට් ඕවන්

17. ඇතන්ස් පෞර රාජ්‍යයේ පැවති පාලන ක්‍රමයේදී එහි ක්‍රියාකාරී සහභාගීත්වය හිමි වූයේ,
1. නගරවාසී වැඩිහිටි පිරිමි පක්‍ෂයටය. 2. නගරවාසී කාන්තාවන්ටය.
3. නගරවාසී වහලුන්ටය. 4. විදේශිකයන්ටය.

18. ශ්‍රී ලාංකික අවුරුදු 21 ට වැඩි උගත් හා ධනවත් පිරිස් අයට පමණක් ඡන්ද බලය හිමි වූයේ,
1. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි. 2. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.
3. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි. 4. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.

19. ක්‍රි.ව. 1865 අංක 17 දරණ මහ නගර ආඥා පනතින් ශ්‍රී ලංකාව තුළ පිහිට වූ මුල්ම මහ නගර සභා තුන වනුයේ,
1. කොළඹ, ගාල්ල, බදුල්ල 2. ගාල්ල, මහනුවර , කුරුණෑගල
3. කොළඹ, මහනුවර, අනුරාධපුරය 4. කොළඹ, මහනුවර, ගාල්ල

20. ගැටුමක් යනු "ප්‍රචණ්ඩ හැප්පීමක් අරගලයක් හෝ හරඹයක් මානුෂික වශයෙන් සිදුවන අරගලයකි"
මෙලෙස ගැටුම පිළිබඳව නිර්වචනයක් ඉදිරිපත් කළේ,
1. විශ්ව කෝෂයයි 2. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයයි
3. යුනෙස්කෝ සංවිධානයයි. 4. යුනිසෙෆ් සංවිධානයයි.

21. රැකියා දැන්වීමක් සඳහා අපට ප්‍රතිචාර දැක්විය නොහැකි ක්‍රමයකි.
1. ජීව දත්ත පත්‍රිකා මඟින් 2. රැකියා ඉල්ලුම් පත්‍ර මඟින්
3. ලිපියක් මඟින් 4. පුද්ගලයින්ගෙන් විමසීමෙන්

22. ඕනෑම පුද්ගලයෙකු පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාමේ වැදගත්කමක් නොවන්නේ,
1. තම හැකියා හා ලැදියා හඳුනාගත හැකිවීම.
2. මිතුරු මිතුරියන් හඳුනාගත හැකිවීම.
3. තම ලැදියා පිළිබඳව අවබෝධ කරගත හැකිවීම.
4. රැකියා තෝරා ගැනීමේ දී උපකාරී වීම.

23. අපට ජීවිතයේ දී විවිධ ගැටුම්වලට මුහුණ පෑමට සිදුවේ. එවිට එම ගැටුම් සුබවාදීව නිරාකරණය කර නොගැනීම නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵලයකි.
1. සම්පත් විනාශ වීම. 2. දේශපාලන ස්ථාවරත්වයක් ඇතිවීම.
3. සාමය ස්ථාපිත වීම. 4. පුද්ගල හා සමාජ සංවර්ධන ඇතිවීම.

24. පළාත් පාලන ආයතනවල නිල කාලය
1. වසර 03 කි. 2. වසර 05 කි. 3. වසර 04 කි. 4. වසර 06 කි.

25. ඒක පක්‍ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකි.
1. ඇමරිකා එක්සත් ජනපදය 2. එක්සත් රාජධානිය
3. ඉන්දියාව 4. කියුබාව

26. රටකට හෝ ජන වර්ගයකට හුදෙකලාව ජීවත් වීමට අපහසුය. එයට බලපා ඇති හේතුවක් නොවන්නේ,
1. සම්පත් විසංතුලනයයි.
2. ගෝලීය විවිධත්වයයි.
3. තම රටට අවශ්‍ය සියලු දේ තම රටතුළ නිපදවාගත නොහැකිවීමයි.
4. සමස්ත ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් නොවීමයි.

27. වර්තමානය වන විට පාසල් සමූපකාර සමිති සාර්ථකව ක්‍රියාත්මක වන රටකි.
1. මැලේසියාව 2. ශ්‍රී ලංකාව 3. ඉන්දියාව 4. ඉන්දුනීසියාව

28. "එකා සැමටත්, සැම එකාටත්" මෙය කුමන ආයතනයේ ආදර්ශ පාඨය ද?
1. නාවික හමුදාවේ 2. ගුවන් හමුදාවේ 3. නාවික හමුදාවේ 4. සමූපකාර ව්‍යාපාරයේ

29. වර්තමාන සමාජයේ දුරකතනය නැතිවම බැරි දෙයක් බවට පත්ව තිබේ. මෙය මුලින්ම සොයාගන්නා ලද්දේ,
1. තෝමස් අල්වා එඩිසන් 2. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්
3. අයිසෙක් නිව්ටන් 4. මාරි කියුරි

30. යෝග්‍ය තාක්‍ෂණය යොද ගැනීමෙන් අපට අත්වන යහපත් ප්‍රතිලාභයකි.
1. පරිසර හානිය සිදුවීම 2. රටේ ආර්ථිකයට දරාගත නොහැකිවීම.
3. සම්පත් අපතේ යාම වැළකීම. 4. ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා නොගැනීම.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයත් තවත් ප්‍රශ්න 05 කට ත් (සියලුම ප්‍රශ්න 06 ක් ) පිළිතුරු සපයන්න.**

(01) i. නීතිය ක්‍රියාත්මක  කරන ආකාරය අනුව බෙදිය හැකි නීති වර්ග දෙක නම් කරන්න.
ii. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ඉහළම අධිකරණ දෙක නම් කරන්න.
iii. සමාජයේ ජීවත්වන විට අපට විවිධ ආරවුල් ඇතිවේ. එම ආරවුල් සමථමණ්ඩලය වෙත යොමු කළ හැකි ක්‍රම 2 ක් ලියන්න.
iv. වර්තමාන සමාජයේ රැකියා වෙළඳපොළ සමන්විත වන අංශ දෙක නම් කරන්න.
v. පුද්ගලයෙකු සතු යහජීවන ගුණාංග 2 ක් ලියන්න.
vi. ජපන්  සමාජයේ  දක්නට ඇති සංස්කෘතික අංග 2 ක් නම් කරන්න.
vii. ප්‍රජාතන්ත්‍රවාදයේ දක්නට ලැබෙන මූලික  ස්වරූප 2 නම් කරන්න.
viii. පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේ දී සැළකිල්ලට ගනු ලබන නිර්ණායක 2 ක් ලියන්න.
ix. අපට සමාජයේ දී දැකිය හැකි ගැටුම් ඇතිවන පාර්ශව 2 ක් නම් කරන්න.
x. කෙනෙකු රැකියාවක් සඳහා තෝරා ගැනීමට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන ක්‍රම 2 ක් ලියන්න.

(02) i. අප සමාජයේ සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම කෙරෙහි බලපාන ප්‍රධාන ආයතන 2 ක් ලියන්න.
ii. ඔබ ඉහතින් සඳහන් කළ එක් ආයතනයකින් ඉටුවන කාර්යයන් 3 ක් ලියන්න.
iii. නීතිය බලාත්මක කිරීම සඳහා ඇති ආයතන 3 ක් නම් කර එයින් එකකින් ඉටුවන සේවාව පැහැදිලි කරන්න.

(03) i. රටක වෙසෙන පුරවැසියෙකු සතු අයිතිවාසිකම් 2 ක් ලියන්න.
ii. රටක ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක වීම කෙරෙහි බලපාන සාධක 03 ක් සඳහන් කරන්න.
iii. මැතිවරණ කටයුතු හා සම්බන්ධ පුරවැසියෙකු සතු යුතුකම් 3 ක් දක්වා එයින් එකක් පැහැදිලි කරන්න.

(04) i. තාක්ෂණය භාවිතය නිසා මිනිසාට බලපා ඇති අහිතකර බලපෑම් 2 ක් ලියන්න.
ii. ඕනෑම ආර්ථිකයක කාලීනව වෙනස්වීම් සිදුවන අංශ 3 ලියන්න.
iii. දේශීයත්වය අගය කරමින් ජාතික එකමුතුව ඇතිකර ගැනීම සඳහා ඔබ සමාජ පුරෝගාමියෙකු ලෙස කටයුතු කළ යුතු ආකාරය කරුණු 3 ක් තුළින් පැහැදිලි කරන්න.

(05) i. වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 2 ක් නම් කරන්න.
ii. පළාත් පාලන ආයතන වලින් මහ ජනතාව උදෙසා ඉටු කෙරෙන කාර්යයන් 3 ක් ලියන්න.
iii. ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය සඳහා කටයුතු කිරීමේ දී පළාත් පාලන ආයතන අවධානය යොමු කළ යුතු කරුණු 03 ක් දක්වා එයින් එකක් සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

(06) i. ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයෙකු සතුවිය යුතු ගුණාංග 02 ක් ලියන්න.
ii. ගැටුම් නිරාකරණයේ දී ඇතිවිය හැකි බාධක 3 ක් ලියන්න.
iii. අ.  පුද්ගලයෙකුට ඇතිවන ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා භාවිතා කළ හැකි ක්‍රම 03 ක් ලියන්න.
ආ. ගැටුම් ඇති වීමට බලපාන හේතු 02 ක් සඳහන් කරන්න.

(07) i. පුද්ගලයෙකුට වෘත්තීය පුහුණුව ලබාගත හැකි රජයේ ආයතන 02 ක් ලියන්න.
ii. රැකියා කරන ස්ථානය අනුව වර්ග කළ හැකි රැකියා වර්ග 3 ක් ලියන්න.
iii. අප රැකියාවක නිරත වී සිටියදී නිවැරදි කාල කළමනාකරණයේ වැදගත්කම් 03 ක් දක්වා එයින් එකක් සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

# තෙවන වාර පරීක්ෂණය - 2019
## පුරවැසි අධ්‍යාපනය

09 ශ්‍රේණිය

### පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 - 3 | 06 - 1 | 11 - 3 | 16 - 4 | 21 - 4 | 26 - 4 |
| 02 - 2 | 07 - 2 | 12 - 3 | 17 - 1 | 22 - 2 | 27 - 1 |
| 03 - 1 | 08 - 3 | 13 - 2 | 18 - 3 | 23 - 1 | 28 - 4 |
| 04 - 2 | 09 - 1 | 14 - 1 | 19 - 4 | 124 - 3 | 29 - 2 |
| 05 - 4 | 10 - 4 | 15 - 3 | 20 - 2 | 25 - 4 | 30 - 3 |

II කොටස

(01) i. දේශීය නීතිය / අන්තර්ජාතික නීතිය

ii. ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය

iii. පොලිසිය මඟින්/ අධිකරණය මඟින් / පෞද්ගලික යොමු කිරීමෙන්

iv. දේශීය රැකියා වෙළඳපල / විදේශීය රැකියා වෙළඳපල

v. සහයෝගයෙන් කටයුතු කිරීම/ බෙදා ගැනීම / අන්‍යයන්ට ගරු කිරීම. / සුහද බව / අවංක බව / සුබවාදී බව/ යුතුකම් ඉටුකිරීම ආදී පිළිතුරු

vi. හිස නමා ආචාර කිරීම / කිමෝනා ඇඳීම / සූමෝ ක්‍රීඩාව/ මළවුන් ඇදහීම

vii. ඍජු / වක්‍ර (නියෝජන)

viii. ජන වාර්ගික අනුපාතය / භූගෝලීය ප්‍රදේශය හා එහි භෞතික ලක්ෂණ / ජනගහනය හා ජන ඝනත්වය / ආර්ථික සංවර්ධන මට්ටම

ix. පුද්ගලයා තුළ / පුද්ගලයන් දෙදෙනෙකු අතර, / පවුල් තුළ / කණ්ඩායම් 2 ක් අතර/ රාජ්‍ය අතර/ ආගම් අතර / අසල්වාසීන් අතර

x. තනි පුද්ගලයකු මඟින්/ මණ්ඩලයක් මඟින්/ නිපුණතා මැන බැලීමෙන්

(02) i. පවුල / පාසල / ආගමික ආයතන / සමාජ සංවිධාන (ආයතන)

ii. පවුල
1. ආදරය දයාව කරුණාව වැනි ගුණාංග ප්‍රගුණ කිරීම.
2. සාමාජිකයින් අතර යහපත් සම්බන්ධතා වර්ධනය
3. ආදර්ශයෙන් මඟ පෙන්වීම
4. චිත්තවේග පාලනයට හුරු කිරීම.
5. ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම. ( ආදී කරුණු 3 ක් පිටුව 4)

පාසල
1. විධිමතක් අධ්‍යාපනයක් ලබාදීම.
2. සංස්කෘතිය පවරාදීම හා ආරක්ෂා කිරීම.
3. පරිසරය ආරක්ෂා කිරීමට අවශ්‍ය නිපුණතා ලබාදීම.
4. යහපත් සමාජානුයෝජනයක් ඇති කිරීම.
5. සමානාත්වතාවයට හා චිත්තවේග පාලනයට හුරු කිරීම.
( ආදී කරුණු වලින් 3 ක් පිටුව 6)

ආගමික ආයතන
1. යහපත් ආකල්ප වර්ධනය කිරීම.
2. විනය හා ශික්ෂණය ඇති කිරීම.
3. ගුණ ගරුක පුරවැසියන් බිහි කිරීම.
4. සිරිත් විරිත් සම්ප්‍රදාය හුරු කිරීමට හා ආරක්ෂාකිරීමට ඉගැන්වීම.
5. සහයෝගීතාවයට උපකාරයට හුරු කිරීම ආදී කරුණුවලින් 3 ක් (පිටුව 7)

සමාජ සංවිධාන
1. සාමූහිකත්වය වර්ධනය කිරීම.
2. ආර්ථික සුරක්ෂිතතාවට සහභාගී වීම.
3. නීති ගරුකව කටයුතු කිරීමට හුරු කිරීම.
4. නායකත්වයට ගරු කිරීම හා අනුගාමික වගකීම් ඉටුකිරීම.
5. ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීම. ( පිටුව 9)

iii. අධිකරණය / ශ්‍රී ලංකා පොලීසිය / නීතිපති දෙපාර්තමේන්තුව / රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව / ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව මින් එකක් පැහැදිලි කිරීමට ලකුණු දෙකක් ලබාදෙන්න.

(03) i. ජීවත්වීමේ අයිතිය / නමක් හා ජාතියක් ලැබීමට අයිතිය/ අධ්‍යාපනය ලැබීමේ අයිතිය/ නීත්‍යානුකූල රැකියාවක යෙදීමට ඇති අයිතිය / තමන් කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය / පාලකයන් තෝරා ගැනීමට ඇති අයිතිය / තමන් කැමති ස්ථානයක ජීවත්වීමේ අයිතිය / තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය දීමේ අයිතිය / වෘත්තීය සමිති වලට බැඳීමේ අයිතිය

ii. රටේ ජනතාව දේශපාලන අවබෝධයෙන් සිටීම/ ජනතාව පාලකයන් තෝරා පත්කර ගැනීමේ දී බුද්ධිමත්ව තීරණ ගැනීම / කැපවීමෙන් කටයුතු කරන, අවංක හා උදාර නායකත්වයක් පැවතීම / රට තුළ යහපත් ආර්ථික මට්ටමක් පැවතීම / ජනමාධ්‍ය නිදහස ක්‍රියාත්මක වීම. / රට තුළ නීතියේ ආධිපත්‍යය පැවතීම / ප්‍රබල

විරුද්ධ පක්ෂයක් තිබීම. ආණ්ඩුවේ කාර්ය පැහැදිලිව වෙන් කර හඳුනාගත හැකි පරිදි පැවතීම.

iii. ඡන්දය ප්‍රකාශ කිරීම / මැතිවරණ නීති රීති වලට අවනත වීම/ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැළකීම/ ජය පරාජය සමව සලකා භුක්ති විඳීම / මැතිවරණ නීති රීති ක්‍රියාත්මක කිරීමට සහය වීම. / අන් අයට බාධාවක් නොවන අයුරින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම / අන් අයගේ අයිතිවාසිකම් වලට ගරු කිරීම / රටේ නීතියට හා සාමයට බාධාවක් නොවන අයුරින් කටයුතු කිරීම/ මෙයින් එකක් පැහැදිලි කිරීමට ලකුණු 2 ක් දෙන්න.

(04) i. මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම / මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
මිනිසුන් යාන්ත්‍රීකරණයකට පත්වීම.
සමාජය සංකීර්ණ වීම.
පරිසර දූෂණය වේගවත්වීම.
මිනිසා විවිධ ලෙඩරෝගවලට ගොදුරු වීම.
තාක්ෂණයට දැඩි ලෙස යොමුවීම නිසා සමාජ සම්බන්ධතා බිඳ වැටීම.

ii. කෘෂි කාර්මික අංශය/ කාර්මික අංශය/ සේවා අංශය

iii. දේශීය සංස්කෘතිය
දේශීය ආහාරපාන (ජාති ආගම් භේදයෙන් තොරව ගැනීම)
ජාතික උත්සව ( සැම ජාතියක්ම එකමුතු වී කටයුතු කරන අයුරු)

(05) i. නගර සභා / මහනගර සභා / ප්‍රාදේශීය සභා

ii. ◆ පුස්තකාල, කියවීම් ශාලා/ළමා උද්‍යාන, ක්‍රීඩාපිටි/ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු පවත්වාගෙන යාම.
◆ පෙර පාසල් (පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගන යාම)
◆ මාර්ග අළුත්වැඩියාව
◆ සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සැපීරීම.
◆ කසල කළමනාකරණය, කසල ප්‍රතිචක්‍රීකරණය
◆ පොදු සුසාන භූමි, ආදාහනාගාර නඩත්තු කිරීම.
◆ පොදු නාන ළිං පවත්වාගෙන යාම, ජල අවශ්‍යතා සැපයීම.
◆ සායන පැවැත්වීම , ඩෙංගු මර්දනය

iii. ◆ ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනාගැනීම.
◆ සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.
◆ ප්‍රාදේශීය නායකයන් බිහි කිරීම.
◆ ප්‍රාදේශීය අවශ්‍යතා හා ඉටු කිරීම සඳහා සම්පත් හඳුනාගෙන ඊට ගැළපෙන සැලසුම් ඉදිරිපත් කිරීම.

(06) i. ඉවසීම / සක්‍රියව සවන්දීම / කාරුණික බව / සුහදශීලී බව /තීරණ ගැනීමේ හැකියාව/ අදහස් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ හැකියාව / චිත්තවේග සමනය/ අන්‍ය අදහස්වලට ගරු කිරීම/ පරිත්‍යාගශීලී බව/ මධ්‍යස්ථ බව/සැම පුද්ගලයෙකුටම ගරු කිරීම/ සාධාරණ විනිශ්චය / අයිතිවාසිකම්වලට ගරු කිරීම/ තම යුතුකම් ඉටු කිරීම.

ii. ◆ වැරදි තීරණ, අදහස් වෙනස් නොකිරීමේ දැඩි ස්ථාවරත්වයකින් සිටීම.
◆ අනම්‍ය තමන් නිවැරදි යැයි සිතන මාතයේම එල්බ සිටීම.
◆ නිවැරදි යයි සිතන තමන් සිතන එකම විසඳුමක රැඳී සිටීම.
◆ විකල්ප ජනනය නොකිරීම.
◆ ගැටුමට සම්බන්ධ සියළුම පාර්ශව ගැටුම් නිරාකරණය සඳහා ඉදිරිපත් නොවීම.
◆ අනෙක් පාර්ශව පරදවා තමා ජය ගැනීමට සිතීම.
◆ අනෙක් පාර්ශවයේ අදහස් අවශ්‍යතා නොසලකා හරිමින් එක් පාර්ශවයක් පමණක් ජයග්‍රණය කිරීමට යාම නිසා ගැටුම්කාරී තත්වය වර්ධනය වීමට ඉඩ හැරීම.

iii. අ. සාකච්ඡා කිරීම / මැදිහත්කරණය / සමථකරණය / විමසීම / උපදේශනය
ආ. සමාජානුයෝගී නොවීම / ආත්මාර්ථකාමී බව/ ආක්‍රමණශීලී බව/ අධි සංවේදී වීම/ විකල්ප නොසොයා තීරණ ගැනීම/ නොගැළපෙන අදහස්/ සමාජ විෂමතා / සම්පත් විසංතුලනය / විවිධ මත වාද / බලය ලබා ගැනීමේ ආශාව / නූගත්කම

(07) i. කාර්මික විද්‍යාල/ වෘත්තිය පුහුණු අධිකාරිය/ ජාතික තරුණ සේවා සභාව/ හෝටල් පාසල/ හෙද විදුහල් / කෘෂි කාර්මික විද්‍යාල/ තාක්ෂණික විශ්ව විද්‍යාල / නීති විද්‍යාල / විද්‍යාතා මධ්‍යස්ථාන

ii. ගෘහස්ථ රැකියා / එළිමහනේ කරන රැකියා / ස්ථිර ස්ථානවල කරන රැකියා / ජංගම රැකියා

iii. ◆ ආයතනයේ නීති රීති අනුව කටයුතු කිරීම.
◆ වැඩ ප්‍රමාදයක් සිදු නොවීම.
◆ ආයතනයක් තුළ හොඳ නමක් දිනාගත හැකිවීම.
◆ ආයතනයේ අරමුණ ඉටුකර දීමට හැකිවීම.
◆ සම්පත් අපතේ යාම වළක්වා ගත හැකිවීම.
◆ මානසික පීඩනයකින් තොර කටයුතු කළ හැකි වීම.
◆ සේවා ලාභීන් තෘප්තිමත් කළ හැකිවීම.
◆ තමන්ට අදාළ රාජකාරිය නියමිත වේලාවට අවසන් කළ හැකිවීම. ආදී කරුණුවලින් 3 ක් පැහැදිලි කිරීමට ලකුණු 2 ක් ලබාදෙන්න.

| | | | | |
|---|---|---|---|---|
| ලකුණු ලබාදීම :- | I පත්‍රය | - 1 x 30 | | = 30 |
| | II පත්‍රය | | | |
| | 1 ප්‍රශ්නය | - 2 x 10 | | = 20 |
| | 2 ,3, 4, 5 | I - 2 | | |
| | | II - 3 | 10x 5 | = 50 |
| | 6,7 | III කරුණුවලට - 3 /පැහැදිලි කිරීමට 2 | | 100 |